# පටුන


1. දැක්ම
2. මෙහෙවර
3. කාර්යයන්
4. නිමැවුම
5. කාර්ය මණ්ඩලය
6. තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය
7. පුහුණු කිරීම් හා හැකියා වර්ධනය
8. සේවා වැඩි දියුණු කිරීම
9. 2014 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කල රෙගුලාසි
10. 2014 වර්ෂය තුළ නිකුත් කල බලපත්‍ර සංඛ්‍යාව සහ අය කල බලපත්‍ර ගාස්තු
11. ආදායම් විශ්ලේෂණය - 2014
    - I. ආදායම් - 2014
    - II. ආදායමෙන් ආපසු ගෙවීම් - 2014
12. වියදම් විශ්ලේෂණය - 2014
    - I. පුනරාවර්තන වියදම හා මූලධන වියදම
    - II. මූල්‍ය ප්‍රභවයන්
13. ආදායම් හා වියදම් විශ්ලේෂණය
14. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම - 29601

ඇමුණුම 01 - සංවිධාන සටහන

# ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

## 1. දැක්ම

යහපත් අනාගතයක් උදෙසා පරිසරය හා මහජනතාව සුරක්ෂිත කිරීම

## 2. මෙහෙවර

රටේ ආරක්ෂාව,ආර්ථිකය,මහජන සෞඛ්‍යය,පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව ක්‍රියාත්මක කිරීම.

## 3. කාර්යයන්

- ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි ප්‍රසිද්ධ කිරීම.
- ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමට යටත්ව ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීම.
- ආනයන හා අපනයන පාලන රෙගුලාසි සම්බන්ධ කරුණුවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විනිමය පාලකවරයාට සහාය වීම.
- වාණිජ බැංකුවලට ආනයන පාලන රෙගුලාසි සම්බන්ධයෙන් මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම.

## 4. නිමැවුම

- 2014 වර්ෂය තුළදී ආනයන හා අපනයන බලපත්‍ර 13,468 ක ප්‍රමාණයක් පමණක් නිකුත් කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වූ ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීම.
- ආනයන බලපත්‍රයට අනුකූලව භාණ්ඩ ආනයනය කලේද යන්න තහවුරු කිරීම් ලබා ගැනීමෙන් පසු හර කිරීම් 17,457 මගින් ආනයන පාලනය විධිමත් කිරීම.
- ආනයන හා අපනයන පාලන ප්‍රතිපත්ති මත විදේශ විනිමය වැය නොවන පදනම මත සිදු කරන ආනයනයන් සඳහා අවසර ලබා දීම.
- ආනයන හා අපනයන පාලන රෙගුලාසිවලට අනුකූල නොවන අවස්ථා සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විනිමය පාලක වෙත අවශ්‍ය සහායන් ලබා දීම.
- ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් වාණිජ බැංකුවලට මෙහෙයුම් උපදේශන නිකුත් කිරීම.
- බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ගාස්තු වශයෙන් රුපියල් මිලියන 751 ක ආදායමක් එක්රැස් කර රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.
- නව පරිගණක වැඩසටහනක් හඳුන්වා දී පරිගණක පද්ධති නවීකරණය කිරීම. නව පරිගණක හා උපාංග ස්ථාපිත කිරීම මගින් නව තොරතුරු ගබඩා පද්ධතියක් හා ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවත් පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම.

## 5. කාර්ය මණ්ඩලය

ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම, හර කිරීම හා ආදායම් එක්රැස් කිරීමේ කාර්යයන් මෙන්ම සාමාන්‍ය කාර්යාල පරිපාලන කටයුතු මෙන්ම ප්‍රතිපත්ති හා සැලසුම් කාර්යයන් පහත කාර්යමණ්ඩලය 2014 වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යොදවන ලදී. ( වගුව අංක 01)

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ සේවාවන් ඉහළම කාර්යක්ෂමතාවයෙන් පවත්වාගෙන යාමටත්, සේවාදායකයින්ට ඵලදායී කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාවක් සැපයීමටත් මෙම කාර්ය මණ්ඩලය වර්ෂය මුළුල්ලේම වගකීමෙන් යුතුව සාමූහිකව ක්‍රියාකරන ලදී.

2014.12.31 දිනට කාර්ය මණ්ඩලය　　　　　　　　　　වගුව අංක 01

| අනු අංකය | තනතුරු නාමය,සේවය හා පන්තිය | අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය සේවක සංඛ්‍යාව | වෙනස/අතිරික්තය/පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 06 | 03 |
| 02 | තෘතීය මට්ටම | 02 | 02 | - |
| 03 | ද්විතීය මට්ටම | 68 | 62 | 06 |
| 04 | ප්‍රාථමික මට්ටම | 19 | 19 | - |
| 05 | වෙනත් - අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම | - | - | - |
| | එකතුව | **98** | **89** | **09** |

# 6.තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය

ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා නව පරිගණක පද්ධතියක් ඇති කිරීම මගින් ආනයන හා අපනයන පාලනයට යටත් අයිතම සඳහා බලපත්‍ර නිකුත් කිරීම වේගවත් හා කාර්යක්ෂමව ඉටු කිරීමට කටයුතු යොදා ඇත.

එනම්,ආනයන හා අපනයන බලපත්‍රයන් නිකුත් කිරීමට ගත වන කාලය පැය 03 කට පමණ සීමා කර ඇති අතර එම බලපත්‍ර හර කිරීම් කටයුතු පැය ½ ක කාල සීමාවක් තුළ ඉටු කර ගැනීමට පහසුකම් සලසා ඇත.

පරිගණක පද්ධතිය මගින් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සියළු පියවරයන් වාර්තාගත කිරීම තුළින් පහසුවෙන් දත්ත හුවමාරු කිරීම හා වාර්තා ලබා ගැනීම සිදු කල හැකි වේ.කාලීනව අවශ්‍ය වන වාර්තා ලබා ගැනීම,ආදායම් වාර්තා ලබා ගැනීම,අතිරේක ගාස්තු අය කිරීම පිළිබඳ වාර්තා ලබා ගැනීම,නිකුත් කල බලපත්‍ර සංඛ්‍යාව හා හර කල බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ වාර්තා ලබා ගැනීම මෙමගින් පහසු වී ඇත.

නිවැරදි හා වේගවත් තොරතුරු ලබා ගැනීමට හැකි වන පරිදි පරිගණක පද්ධති හඳුන්වා දීම තුළින් පෙර පැවති ක්‍රියාවලීන් වඩාත් විශ්වසනීය හා කාර්යක්ෂම වී ඇත.එමෙන්ම බලපත්‍ර සඳහා ගෙවීම් කටයුතු ඉක්මන් වී ඇති අතර අතිරේක ගාස්තු,බලපත්‍ර ගාස්තු අය කිරීමේ ක්‍රමය ද පහසු වී ඇත.

නව තොරතුරු පද්ධතිය මගින් ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරය හා බලපත්‍ර නිකුත් කිරීමේදී නිර්දේශ සපයන වෙනත් රාජ්‍ය ආයතන සමග වෙබ් අවකාශ හරහා සම්බන්ධ වීමට කටයුතු යොදා ඇත.

## 7 .පුහුණු කිරීම් හා හැකියා වර්ධනය

දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම වර්ධනය කර සේවාවන් ඉහළ කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායකත්වයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා 2014 වර්ෂය තුළදී පහත පරිදි දේශීය සහ විදේශීය පුහුණු සඳහා නිලධාරින් යොමු කර ඇත.

__දේශීය පුහුණු__

I. මාණ්ඩලික නිලධාරින්
- Capacity Building Programme for the officers of Sri Lanka Administrative Service (SLAS Class – I) - 01
- Training On “Programme Global Shield” - 02

II. කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින්
- භාෂා පුහුණු,පරිපාලනමය සහ මූල්‍ය කළමනාකරණ පාඨමාලා - 12
- පරිගණක පාඨමාලා - 01

- Certificate Course in Logistic Service, Freight Forwarding & Multimodal Transport - 02

III. සමස්ත කාර්ය මණ්ඩලය

- ආනයන හා අපනයන මූලා රෙගුලාසි , ජාත්‍යන්තර ප්‍රවාහනය හා අනෙකුත් විදේශීය වෙළඳාම සම්බන්ධ ප්‍රතිපත්ති දැනුවත් කිරීමේ වැඩමුළුව

<u>**විදේශීය පුහුණු**</u>

| නිලධාරියාගේ නම | පුහුණු පාඨමාලාව |
|---|---|
| ඩී.එස්.පී.සේනාරත්න මහතා - පාලක ජනරාල් | 1. Thematic Meeting related to phase – Out of HCFCs - Thailand |
| කේ.එන්.කේ.විද්‍යාලංකාර - සහකාර පාලක | 1. Foreign Training related to MHRM degree in University of Kelaniya (University Putra Malaysia) |

# 8. සේවා වැඩි දියුණු කිරීම

සේවාවන් වැඩි දියුණු කිරීම උදෙසා මේ දක්වා විවිධ පියවර රාශියක් අනුගමනය කර ඇත.ආයතනික ව්‍යුහය වෙනස් කිරීම,නව පරිගණක පද්ධති හඳුන්වා දීම,නව පුහුණු කිරීම් තුළින් කාර්යක්ෂම සේවාවක් පාරිභෝගිකයාට ලබා දීම ඒවා අතර ප්‍රධාන වේ.

ආනයන හා අපනයන බලපත්‍ර ආකෘති පත්‍රය වැඩි දියුණු කිරීම මගින් වඩා පහසුවෙන් ආනයන හා අපනයන කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ඉඩ සලසා දීම මෙන්ම අක්‍රමිකතා වැළැක්වීම උදෙසා බලපත්‍රය තුළ විවිධ ආරක්ෂණ උපක්‍රම භාවිතය ද හඳුන්වා දී ඇත.

හර පත්‍ර ආකෘතිය වැඩි දියුණු කිරීම මගින් පාරිභෝගිකයාට කඩිනමින් තොරතුරු පරීක්ෂා කිරීමට හැකිවීම මෙන්ම රේගුවෙන් ආනයනය නිදහස් කර ගැනීමේ කාර්යය ද පහසු වී ඇත.

නව සේවා කවුළු විවෘත කිරීම මගින් පාරිභෝගිකයාට පහසු හා කඩිනම් සේවාවක් ලබා දීමට හැකි වී ඇත.පාරිභෝගිකයින්ට සපයන සේවා ඉහළ නැංවීම සම්බන්ධයෙන් පහත කරුණු දෙපාර්තමේන්තුව පසුගිය වසර තුළ ක්‍රියාවට නංවා ඇත.

සාමාන්‍ය ජන ජීවිතයට අවශ්‍ය වන ආහාර පාන වර්ග ශ්‍රී ලංකා ප්‍රමිති හා පිරිවිතර පාලනයට යටත්ව ආනයනය කිරීම සම්බන්ධයෙන් ප්‍රමිති හඳුන්වා දීම මගින් මහජන සෞඛ්‍යය හා පරිසර සුරක්ෂිතභාවය තහවුරු කිරීම සිදු කෙරිනි.එනම් ජන ජීවිතයට සෘජුවම බලපාන සේවාවන් සම්බන්ධයෙන් විශේෂ පියවරක් ලෙස ආනයනික ඖෂධවල ජීව කාලය රට තුළට පැමිණෙන විට මුළු ජීව කාලයෙන් අවම වශයෙන් ¾ක් තිබිය යුතු බව තීරණය කරනු ලැබූ අතර වෙළඳපල තුළ කල් ඉකුත්වූ ඖෂධ සෞඛ්‍ය අමාත්‍යංශය හා එක්ව විනාශ කිරීමට හෝ ප්‍රති අපනයනය සඳහා කටයුතු කිරීම සිදු කෙරිණි.

පරිසරයට තර්ජනයක්ව පවතින දිරාපත් නොවන අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශයේ අපද්‍රව්‍ය කලමනාකරණ ඒකකයේ සහයෝගය ඇතිව එම ද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් කර ඇත.

පරිසරයට සහ මහජන සෞඛ්‍යයට අහිතකරව පැවති ආනයනයක් වන භාවිතා කරන ලද CFC විදුලි බුබුළු/ ශීතකරණ / අධි ශීතකරණ / වායු සමීකරණ ආදී ආනයනයන් ආනයන බලපත්‍ර පාලනයට යටත් කරන ලදී. ශ්‍රී ලංකා රජය විසින් එකඟ වී ඇති පරිදි මොන්ට්‍රියල් සම්මුතියට අනුකූලව යමින් වායුගෝලයට ඕසෝන් ක්ෂය කාරක වායු මුදා හැරීම වැළැක්වීම එසේත් නැතිනම් පාලනය මෙහි අවසාන අපේක්ෂාවයි.

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සහ පාලනය උදෙසා පාවිච්චි කල පරිගණක, රෙදි සෝදන යන්ත්‍ර හා රූපවාහිනි යන්ත්‍ර ආනයන බලපත්‍ර පාලනයට යටත් කරනු ලැබීය.එමගින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රට තුළට පැමිණීම පාලනය කිරීමට හැකියාව ලැබිණි.

උක්ත කරුණු සලකා බැලීමේදී සේවාවන් වැඩි දියුණු කිරීම උදෙසා ගනු ලැබූ ඍජු හා වක්‍ර පියවරයන් හඳුනා ගත හැකි අතර එමගින් රටේ ව්‍යාපාරික ප්‍රජාවට මෙන්ම පොදු මහ ජනතාවට සමබරව හා අපක්ෂපාතීව දෙපාර්තමේන්තුවක් ලෙස ඉටු කළ යුතු සේවාව උපරිමව,කාර්යක්ෂමව හා නිවැරදිව ඉටු කිරීමට ඉඩ ප්‍රස්ථාව ලැබී ඇත.

## 9. 2014 වර්ෂය තුළ දී ප්‍රකාශයට පත් කළ නව රෙගුලාසි

ආනයනයන් හා අපනයනයන් පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් නව රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට පහත සඳහන් අතිවිශේෂ ගැසට් නිවේදනයන් ප්‍රකාශයට පත් කර ක්‍රියාත්මක කරන ලදී.

වගුව අංක 02

| අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කළ දිනය | අතිවිශේෂ ගැසට් පත්‍ර අංකය | අන්තර්ගතය |
|---|---|---|
| 2014.01.04 | 1844/49 | ආනයනික අයිතම 123ක් SLSI නිර්දේශයට ලක් කිරිම. |
| 2014.02.21 | 1846/16 | මගී ප්‍රවාහන හා භාණ්ඩ ප්‍රවාහන මෝටර් රථවල සංශෝධනයන්. |
| 2014.01.02 | 1843/40 | කුරුඳු සඳහා ප්‍රමිති හා පිරිවිතර පරික්ෂා කිරීමේ කාලය දීර්ඝ කිරීම |
| 2014.07.21 | 1872/5 | ආනයන හා අපනයන පාලන බලපත්‍රය හා ඊට අදාළ හර පත්‍රය නව මුහුණුවරක් ගැනීම |
| 2014.10.02 | 1882/40 | සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 03.02,03.02.89,03.03 හා 03.03.89 ශ්‍රී ලංකාව තුළට ලින්නා මසුන් ආනයනය කිරීම සම්පූර්ණයෙන් තහනම් කිරීම. |

| | | |
|---|---|---|
| 2014.09.30 | 1882/5 | ඛණිජ තෙල් නිෂ්පාදන යටතේ පෙට්රල්, ඩීසල්,භූමිතෙල්,ගුවන් යානා තෙල් සහ තාර සම්බන්ධයෙන් ආනයන බලපත්‍ර ගාස්තු සංශෝධන කිරීම. |
| 2014.10.10 | 1883/16 | සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0701.90 යටතේ අළුත් හෝ ශීත කල අර්තාපල් ආනයනය අත්හිටුවීම. |
| 2014.10.24 | 1885/50 | ඇතැම් මෝටර් රථ සම්බන්ධයෙන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සංශෝධනයට ලක් කිරීම. |

## 10. 2014 වර්ෂයේ නිකුත් කල බලපත්‍ර සංඛ්‍යාවන් සහ අය කල බලපත්‍ර ගාස්තු

වගුව අංක 03

| අංක | විස්තරය | සංකේත අංකය | බලපත්‍ර සංඛ්‍යාව | බලපත්‍ර ගාස්තුව |
|---|---|---|---|---|
| **ඒකක 01 - ඖෂධ** | | | | |
| 1 | බටහිර ඖෂධ | 400 | 1843 | 115,822,891.01 |
| 2 | පශු | 410 | 335 | 4,063,292.71 |
| 3 | ආයුර්වේද | 420 | 114 | 554,697.66 |
| 4 | හෝමියෝපති | 430 | 09 | 8,956.26 |
| 5 | ශල්‍ය උපාංග | 450 | 199 | 4,101,353.91 |
| **උප එකතුව** | | | **2500** | **124,551,191.55** |
| **ඒකක 02 -වාහන** | | | | |
| 6 | විදේශ විනිමය ඉපයීම මත | 100 | 29 | 3,107,917.70 |
| 7 | විදේශ රැකියා නියුක්තිකයින්ගේ ත්‍යාග | 110 | - | - |
| 8 | විදේශකයින් විසින් ආනයනය කරන වාහන | 120 | - | - |
| 9 | තානාපති කාර්යාල | 130 | 2 | 5,923.00 |
| 10 | ආබාධිත පුද්ගලයින් සඳහා ත්‍යාග | 140 | 3 | 126,829.50 |
| 11 | සමාජ සේවා සංවිධාන ත්‍යාග | 150 | 22 | 963,669.81 |
| 12 | නේවාසික විදේශකයින් | 160 | 3 | 8,035.75 |
| 13 | පූජනීය ස්ථාන සඳහා වාහන ආනයනය | 170 | 45 | 5,199,620.04 |
| 14 | විශේෂ කාර්යය යන්ත්‍ර | 180 | 38 | 3,585,947.70 |
| 15 | අපනයන ප්‍රවර්ධනය සඳහා තාවකාලික ආනයනය | 190 | - | - |
| 16 | අවමංගල රථ | 200 | 18 | 1,109,999.95 |
| 17 | ගුවන්යානා / හෙලිකොප්ටර් සඳහා අමතර කොටස් | 210 | 52 | 1,520,670.29 |
| 18 | එන්ජින් | 220 | 2 | 19,883.55 |
| 19 | කැබින් | 230 | 55 | 89,958,795.63 |
| 20 | බොඩිෂෙල් | 235 | 13 | 144,307.34 |
| 21 | පාවිච්චි කළ මෝටර් බයිසිකල් | 240 | 24 | 169,999.90 |
| 22 | විවිධ | 250 | 129 | 22,763,308.23 |
| 23 | තානාපති සේවයේ නිලධාරින් ආනයනය කරන | 260 | 53 | 314,083.29 |

| | | | | |
|---|---|---|---|---|
| | වාහන | | | |
| 24 | බර වාහන | 270 | 184 | 23,052,581.48 |
| 25 | බර වාහන (LC Permit) | 275 | 5 | 22,712.55 |
| 26 | වාහන අමතර කොටස් | 280 | 91 | 907,834.37 |
| 27 | ටයර් | 285 | 3 | 7,125.49 |
| 28 | වැසි | 290 | 19 | 2,786,998.61 |
| 29 | සීට් | 320 | 168 | 3,945,548.87 |
| 30 | පරික්ෂා කිරීම් වලදී වන කොන්දේසි වලට එකඟ නොවීම | 321 | - | - |
| උප එකතුව | | | **958** | **159,721,793.05** |

| අංක | විස්තරය | සංකේත අංකය | බලපත්‍ර සංඛ්‍යාව | බලපත්‍ර ගාස්තුව |
|---|---|---|---|---|
| ඒකක 03 - රසායන ද්‍රව්‍ය | | | | |
| 31 | රසායනික ද්‍රව්‍ය | 500 | 976 | 5,688,730.15 |
| 32 | ඛනිජ තෙල් නිෂ්පාදන | 510 | 946 | 245,353,270.64 |
| 33 | පළිබෝධ නාශක | 520 | 1237 | 25,431,397.58 |
| 34 | විකිරණ ද්‍රව්‍ය | 530 | 87 | 290,106.13 |
| 35 | මධ්‍යසාර | 540 | 277 | 4,350,236.61 |
| 36 | සත්ත්ව නිෂ්පාදන | 550 | 717 | 7,596,384.25 |
| 37 | ධාන්‍ය | 570 | 96 | 10,216,993.19 |
| උප එකතුව | | | **4339** | **298,927,118.55** |
| ඒකක 04 - විදුලි සංදේශ උපකරණ හා වෙනත් | | | | |
| 38 | සිගරට් කොළ | 670 | 43 | 452,142.00 |
| 39 | පරිගණක | 625 | 215 | 10,818,782.69 |
| 40 | ශීතකාරක ගෑස් වර්ග | 640 | 41 | 152,750.11 |
| 41 | මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර | 690 | 160 | 492,158.30 |
| 42 | දුරස්ථ පාලක සෙල්ලම් බඩු | 660 | 126 | 132,290.28 |
| 43 | සන්නිවේදන උපකරණ හා ජංගම දුරකථන | 620 | 2859 | 44,083,303.38 |
| 44 | වායුසමීකරණ යන්ත්‍ර,පාවිච්චි කරන ලද ශීතකරණ හා අධි ශීතකරණ | 630 | 42 | 208,797.18 |
| 45 | පාවිච්චි කරන ලද රෙදි සෝදන යන්ත්‍ර | 635 | 32 | 728,531.05 |
| 46 | කාලගුණ බැලුන් | 695 | 5 | 832,274.00 |
| උප එකතුව | | | **3523** | **57,901,028.99** |
| ඒකක 05 -විවිධ ආනයන හා අපනයන | | | | |
| 47 | ගුවන්යානා අමතර කොටස් | 210 | 51 | 173,292.08 |
| 48 | ඇල්කොහොල් | 540 | 64 | 532,480.00 |
| 49 | සත්ව හා සත්ව නිෂ්පාදන | 550 | 471 | 447,154.00 |
| 50 | තේ | 570 | 477 | 6,991,398.00 |
| 51 | රසායනික ද්‍රව්‍ය හා වල්නාශක | 500 | 47 | 369,882.90 |
| 52 | රසායනික ද්‍රව්‍ය, කෘෂිකාර්මික රසායන වල්නාශක | 520 | 74 | 1,126,082.00 |
| 53 | කාසි | 610 | 06 | 40,044.65 |
| 54 | පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි | 600 | 136 | 1,483,506.00 |
| 55 | ලෝහ කැබලි,සුන්බුන් හා වෙනත් | 715 | 139 | 247,348.30 |
| 56 | අබිලි ලෝහ සුන්බුන් | 710 | 128 | 5,747,230.00 |
| 57 | විවිධ | 250 | 04 | 154,272.90 |

| | | | | |
|---|---|---|---|---|
| 58 | ඛණිජ තෙල්, ඛණිජ තෙල් නිෂ්පාදන | 510 | 55 | 235,618.30 |
| 59 | දැව තෙල් | 700 | 415 | 207,500.00 |
| 60 | පාවිච්චි කළ ඇඳුම් | 720 | 74 | 1,774,635.00 |
| 61 | ක්‍රීඩා භාණ්ඩ | 650 | 07 | 457,468.70 |
| 62 | විදුලි සංදේශ උපකරණ හා ජංගම දුරකථන | 620 | 271 | 816,782.50 |
| 63 | ඉරන ලද දැව කොටස් | 602 | 17 | 17,600.00 |
| 64 | පාවිච්චි කරන ලද ගෘහ භාණ්ඩ | 680 | 82 | 7,582,560.00 |
| 65 | ඉවත ලන සිලින්ඩර් | 640 | 02 | 2,000.00 |
| 66 | ප්ලාස්ටික් කෑම භාජන | 730 | 05 | 5,544.53 |
| 67 | විකිරණශීලි ද්‍රව්‍ය | 530 | 02 | 2,000.00 |
| උප එකතුව | | | **2148** | **28,414,399.86** |
| මුළු එකතුව | | | **13468** | **669,515,532.00** |

## 11. ආදායම් විශ්ලේෂණය - 2014

දෙපාර්තමේන්තුව 2014 වර්ෂය තුළදී රුපියල් මිලියන 751 ක ආදායමක් උපයා ගැනීමට සමත් විය.2013 වර්ෂය හා සැසඳීමේදී ආදායම 63% කින් වැඩි වී ඇත.එය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

බලපත්‍ර ආදායම - රු. 669,515,532.00

අතිරේක ගාස්තු - රු. 80,864,017.00

සංශෝධන ගාස්තු - රු. 1,126,767.00

### I. ආදායම - 2014

ආදායම පිළිබඳ විස්තර වගුව අංක 03 මගින් ඉදිරිපත් කර ඇත.

වගුව අංක 04

| විස්තරය | 2013 සත්‍ය ආදායම රු. | 2014 අනුමත ඇස්තමේන්තුව රු. | 2014 ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව රු. | 2014 සත්‍ය ආදායම රු. |
|---|---|---|---|---|
| ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු | 458,372,095 | 600,000,000 | 700,000,000 | 751,552,566,055 |

## II. ආදායමෙන් ආපසු ගෙවීම - 2014

වගුව අංක 05

| විස්තරය | මුදල රු. |
|---|---|
| ආපසු ගෙවීම - ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු | 100,699.63 |

# 12. වියදම් විශ්ලේෂණය - 2014

## I. පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම

2014 වර්ෂය සඳහා රුපියල් මිලියන 54.83 ක් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා ප්‍රතිපාදනය කර ඇත.වියදම රුපියල් මිලියන 54.40 ක් දරා ඇත.එය මුළු ප්‍රතිපාදනයෙන් 99.22% ක් වේ.විස්තර අංක වගුව යටතේ දක්වා ඇත.(වගුව අංක 06)

ශීර්ෂ අංකය : 296

අමාත්‍යාංශය : ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය : 01

ව්‍යාපෘතිය : 01

| විස්තරය | 2013 සත්‍ය වියදම රුපියල් | 2014 අනුමත ඇස්තමේන්තුව රුපියල් | 2014 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2014 සත්‍ය වියදම රු. | ප්‍රතිපාදන උපයෝජනය % |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | | | | | |
| පෞද්ගලික පඩි | 25,767,491 | 2,990,000 | 31,685,000 | 31,537,653.29 | 99.53% |
| වෙනත් පුනරාවර්තන | 12,503,633 | 15,820,000 | 14,606,000 | 14,446,621.47 | 98.91% |
| පුනරාවර්තන වියදම් එකතුව | 38,271,124 | 45,720,000 | 46,291,000 | 45,984,274.76 | 99.34% |
| මූලධන | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2001 - ගොඩනැගිලි ඉදිකිරීම් | | | | | |
| 2003 - වාහන | 27,816 | 300,000 | 300,000 | 181,948 | 60.65% |
| 2102 - ලී බඩු හා කාර්යාල උපකරණ | 4,399,348 | 4,000,000 | 7,561,693 | 7,591,692 | 99.99% |
| 2401 - පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 175,000 | 500,000 | 679,000 | 679,000 | 100% |
| මූලධන වියදම් එකතුව | 4,602,164 | 4,800,000 | 8,540,693 | 8,422,640.38 | 98.61% |
| මුළු එකතුව | 42,873,288 | 50,520,000 | 54,831,693 | 54,406,915.14 | 99.22% |

### II. මූල්‍ය ප්‍රභවයන්

ඒකාබද්ධ අරමුදල මගින් දේශීය අරමුදල් යටතේ වෙන් කර දුන් මුදල් වියදම් කිරීමේදී කාර්යක්ෂමව හා ඵලදායීව වියදම් කිරීමට පියවර ගෙන ඇත.(වගුව අංක 07)


| විස්තරය | 2013 සත්‍ය වියදම රු. | 2014 අනුමත ඇස්තමේන්තුව රු. | 2014 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2014 සත්‍ය වියදම රු. |
|---|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල 11 - දේශීය අරමුදල් | 42,873,228.00 | 50,520,000.00 | 54,831,693.00 | 54,406,915.14 |
| මුළු වියදම | 42,873,228.00 | 50,520,000.00 | 54,831,693.00 | 54,406,915.14 |

## 13. ආදායම් සහ වියදම් විශ්ලේෂණය - 2014

දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 54 ක් වියදම් කර රුපියල් මිලියන 751 ක ආදායමක් උපයා ඇත. එය වගුවකින් දක්වා ඇත.(වගුව අංක 08)

| මාසය | ආදායම (රු.) | වියදම(රු.) |
|---|---|---|
| ජනවාරි | 81,438,145.60 | 3,390,242.18 |
| පෙබරවාරි | 42,328,894.89 | 4,434,338.53 |
| මාර්තු | 62,101,307.99 | 3,769,153.78 |

| | | |
|---|---|---|
| අප්‍රේල් | 47,055,022.45 | 3,708,222.82 |
| මැයි | 62,563,708.69 | 5,927,136.05 |
| ජූනි | 60,067,467.28 | 3,970,057.40 |
| ජූලි | 60,042,182.39 | 3,893,004.94 |
| අගෝස්තු | 62,087,471.29 | 4,406,153.43 |
| සැප්තැම්බර් | 69,376,487.61 | 7,323,406.94 |
| ඔක්තෝබර් | 52,647,747.38 | 4,689,396.15 |
| නොවැම්බර් | 63,831,988.54 | 3,783,870.54 |
| දෙසැම්බර් | 88,012,142.47 | 5,111,932.38 |
| එකතුව | 751,552,566.55 | 54,406,915.14 |





## 14. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම - 29601

2014 වර්ෂයට අදාළව මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම අනුමත සීමා යටතේ පවත්වා ගෙන ඇත.(වගුව අංක 09)

ශීර්ෂ අංකය : 296

අමාත්‍යාංශය : ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

| 2013 සත්‍ය වියදම | 2014 අනුමත ඇස්තමේන්තුව | 2014 සංශෝධිත ඇස්තමේන්තුව | 2014 සත්‍ය වියදම |
|---|---|---|---|
| 11,929,263.50 | | | 12,783,664.00 |
| 1,530,266.00 | 4,000,000.00 | | 3,354,428.00 |
| 2,283,738.50 | | | 2,195,304.50 |
| 15,743,268.00 | | | 18,333,396.50 |
| 2,202,514.00 | 2,000,000.00 | | 2,367,557.00 |
| 757,090.00 | | | 1,582,792.00 |
| 12,783,664.00 | | | 14,383,047.50 |




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Controller General | - 01 | Accountant | - 01 | H Clerk : Head Clerk (MA) | - 07 | ITA : Information Technology Assistant | - 01 |
| Import and Export Controller | - 01 | AO : Administrative Officer | - 01 | MA : Management Assistant | - 46 | DMA : Data Management Assistant | - 01 |
| AC : Assistant Controller | - 07 | ITO : Information Technology Officer | - 01 | CMA : Chief Management Assistant | - 02 | PA : Policy & Planning Assistant | - 01 |
| | | IA/DO Investigation Assistant or Development Officer | - 06 | RA : Research Assistant | - 01 | BA : Budget Assistant | - 01 |
| | | | | | | OES : Office Employee Service | - 15 |
| | | | | | | Drivers | - 04 |